# තරුණ කටයුතු සංවර්ධනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

## තෙවන හා සිවුවන මට්ටම

## 2023/2024

## ශිෂ්‍ය උපදේශන අත්පොත

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
இலங்கை திறந்த பல்கலைக்கழகம்
THE OPEN UNIVERSITY OF SRI LANKA
Faculty of Humanities and Social Sciences
සමාජ අධ්‍යයන අංශය | Department of Social Studies | சமூகக் கற்கைகள் துறை

2023 ජුනි 15,
තරුණ කටයුතු අධ්‍යයන ඒකකය ,
සමාජ අධ්‍යයන අංශය .

ශිෂ්‍ය, ශිෂ්‍යාවනි.

**<u>නැවත ලියාපදිංචි වූ සිසුන් හට පවත්වනු ලබන දැනුවත්කිරීමේ වැඩසටහන සඳහා ආරාධනා ලිපිය.</u>**

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සමාජ අධ්‍යයන අංශය විසින් සියලුම ලියාපදිංචි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සාදරයෙන් පිළිගනිමු .

2023 ජූනි මස 15 වන දින සවස 6.30 සිට 08.30 දක්වා Zoom තාක්ෂණය ඔස්සේ සියලුම ලියාපදිංචි සිසුන් සඳහා දැනුවත් කිරීමේ සැසිය පවත්වනු ලැබේ. මෙම සැසිය මඟින් ඔබට OUSL හි සාර්ථක ඉගෙන ගන්නෙකු වීමට අවශ්‍ය දුරස්ථ මාදිලියේ ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රම, වැදගත් අධ්‍යයන කුසලතා මෙන්ම අඛණ්ඩ ඇගැයීම්වල ස්වභාවය ඔබට හඳුන්වා දෙයි. මෙම වැඩසටහනට සම්බන්ධ වීම සියලු සිසුන් සඳහා අනිවාර්ය වේ.

සැසියේ න්‍යාය පත්‍රය විද්‍යුත් තැපෑල ඔස්සේ ඔබට එවනු ලැබේ. කරුණාකර ඔබේ වාර්තා පොත සහ ශිෂ්‍ය මාර්ගෝපදේශ Zoom සැසිය අතරතුර ඔබ ළඟ තබා ගන්න.

ඔබගේ උත්සාහයට සුබ පැතුම්!

අංශ ප්‍රධානී,
ආචාර්ය පත්මනේසන්,
සමාජ අධ්‍යයන අංශය.

**අන්තර්ගතය**

**පටුන** **පිටු අංකය**


1. මෙම පොත භාවිතා කරන්නේ කෙසේද? 05
2. පාඨමාලාව සඳහා ලබා දෙන පරිශීලන ග්‍රන්ථ 05
3. OUSL විද්‍යුත් තැපැල 06
4. ඔබ SMS Alert සේවය 06
5. MYOUSL පහසුකම් භාවිතා කළ හැකි ආකාරය 06
6. අඛණ්ඩ ඇගයීම් ලකුණු අන්තර්ජාලය මගින් ලබා ගන්නේ කෙසේද? 07
7. අවසාන පරීක්ෂණවලට අදාළ ලකුණු අන්තර්ජාලය මගින් පරීක්ෂා කර ගන්නේ කෙසේද? 07
8. අවසාන පරීක්ෂණය සඳහා ලියාපදිංචි වීම 08

**පළමුවන කොටස - අධ්‍යයන උපදෙස්**

9. පාඨමාලාව හැඳින්වීම 10
10. පාඨමාලා ව්‍යුහය (3 වන මට්ටම හා 4 වන මට්ටම) 11
11. අප සමග සම්බන්ධ විය හැකි ආකාරය 12
12. විෂය ඇගයීම් ක්‍රමය (Course Evaluation Method) 12
13. ලකුණු ඇගයීමේ ක්‍රමය 14
14. ඇගයීම් ලකුණු ශ්‍රේණිගත කිරීම (The Grading System) 16

**දෙවන කොටස - අඛණ්ඩ ඇගයීම් සඳහා කාලසටහන් පිළිබඳ උපදෙස්**

15. අඛණ්ඩ ඇගයීම් විභාග කාලසටහන - තුන්වන මට්ටම 18
16. වාර්ෂික ඉගෙනුම් දින දර්ශනය : තුන්වන මට්ටම 19
17. අඛණ්ඩ ඇගයීම් විභාග කාලසටහන-සිව්වන මට්ටම 20
18. වාර්ෂික ඉගෙනුම් දින දර්ශනය : හතරවන මට්ටම 21
19. ඔබේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාව 22
20. සියලු ක්‍රියාකාරකම් වලට අදාළ දින සටහන 23
21. උපදේශන පත්‍රිකාව (Counselling Form) 24
22. පරිපාලනමය ගැටලු විසදා ගැනීම සඳහා විමසීම් කිරීම 25

**තුන්වන කොටස - ඉගෙනුම් ජර්නලය (Learning Journal-LJ) හා පැවරුම් සඳහා උපදෙස්**

23. ප්‍රත්‍යාවර්තීය ඉගෙනුම් ජර්නලය (LJ) ලිවීම සඳහා උපදෙස් 32
24. ප්‍රත්‍යාවර්තීය ඉගෙනුම් ජර්නලය (LJ) භාරදීමේ දී පිළිපැදිය යුතු කරුණු 35

25. පැවරුම් භාරදීමේදී පිළිපැදිය යුතු කරුණු 36

**හතරවන කොටස - පැවරුම් (TMA) මාතෘකා**

27 නිවසේදී සකසා එවිය යුතු පැවරුම් සඳහා මාතෘකා 39

**වගු ලැයිස්තුව**

වගුව 01 :තුන්වන මට්ටම (පළමු වසර) පළමු වර්ෂ අර්ධය සඳහා විෂයන් 11
වගුව 02 :තුන්වන මට්ටම (පළමු වසර) දෙවන වර්ෂ අර්ධය සඳහා විෂයන් 11
වගුව 03 :හතරවන මට්ටම (දෙවන වසර) පළමු වර්ෂ අර්ධය සඳහා විෂයන් 11
වගුව 04 : හතරවන මට්ටම (දෙවන වසර) දෙවන වර්ෂ අර්ධය සඳහා විෂයන් 11
වගුව 05 : ඇගයීම් ලකුණු සහ ඊට අදාළ ශ්‍රේණීන් 16
වගුව 06 : අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණ පිළිතුරු පත්‍ර භාරදීම සඳහා අවසන් දින (තුන්වන මට්ටම - පළමු වර්ෂ අර්ධය) 18
වගුව 07 : වාර්ෂික ඉගෙනුම් දින දර්ශනය - 3 වන මට්ටම 2023/2024 19
වගුව 08 : අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණ පිළිතුරු පත්‍ර භාරදීම සඳහා අවසන් දින (හතරවන මට්ටම - පළමු වර්ෂ අර්ධය) 20
වගුව 09 : වාර්ෂික ඉගෙනුම් දින දර්ශනය - 4 වන මට්ටම 2023/2024 21
වගුව 10 : අධ්‍යයන ආධාරක අංශවල සම්බන්ධතා තොරතුරු 25
වගුව 11 : ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන භාර නිලධාරීන් පිළිබඳ විස්තර 28
වගුව 12 : OUSL අධ්‍යයන මධ්‍යස්ථාන 29



## 01. මෙම පොත භාවිත කරන්නේ කෙසේද?

මෙම පොත තරුණ කටයුතු සංවර්ධනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට ලියාපදිංචි වූ ඔබට අධ්‍යයන වැඩසටහනට අදාළ විශේෂ තොරතුරු ලබාදීමට මාර්ගෝපදේශකත්වය සපයයි. මෙකී පොතෙහි ප්‍රධාන කොටස් 04 ක් අන්තර්ගත වේ.

**1 වන කොටස -** මෙම කොටසින් මෙම පාඨමාලාවට අදාළ තුන්වන හා හතරවන මට්ටම් සඳහා ලියාපදිංචි වූ සිසුනට අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් ඇතුළත් වේ. පාඨමාලාවේ ආකෘතිය, (අඛණ්ඩ ඇගයීම් හා අවසාන පරීක්ෂණයට අදාළ තොරතුරු) පාඨමාලාවේ විෂයන්ට ශ්‍රේණි ලබා ගත හැකි ආකාරය හා අඛණ්ඩ ඇගයීම් සම්පූර්ණ කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් ලබා දේ.

**2 වන කොටස -** පාඨමාලාව හා සම්බන්ධ පරිපාලනයට අදාළ උපදෙස් ඒ ඒ අදාළ අංශවලට සම්බන්ධ විය හැකි දුරකථන අංක හා පාඨමාලාවට අදාළ කාලසටහන් හා අදාළ විස්තර මෙහි ඇතුලත් වේ.

**3 වන කොටස -** ඒ ඒ විෂයයන්ට අදාළ ව අඛණ්ඩ ඇගයීම් සම්බන්ධ උපදෙස් සපයයි (LJ සහ TMA).

**4 වන කොටස -** ඒ ඒ විෂයන්ට අදාළව ඔබ විසින් නිවසේ දී සම්පූර්ණ කළයුතු පැවරුම (TMA) සඳහා අවශ්‍ය මාතෘකා මෙම කොටසෙහි ඇතුළත් වේ.

❖ අධ්‍යයන වර්ෂයට අවශ්‍ය උපදෙස් මෙම පොතෙහි අඩංගු වන බැවින් අධ්‍යයන වර්ෂය අවසන් වන තෙක් මෙම පොත ඔබ විසින් ළඟ තබා ගත යුතු අතර එය අධ්‍යයන වර්ෂය පුරා නිරතුරුවම භාවිත කරමින් එහි අන්තර්ගත උපදෙස් අනුගමනය කළ යුතු වේ.

❖ අධ්‍යයන හෝ පරිපාලන කටයුතු හා සම්බන්ධ ඕනෑම ගැටලුවක දී මෙම පොත භාවිත කිරීම අනිවාර්ය වේ. එමගින් ඔබගේ ගැටලුවලට විසඳුම් සොයා ගැනීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශනය සපයනු ලැබේ.

## 02. පාඨමාලාව සඳහා ලබා දෙන පරිශීලන ග්‍රන්ථ

ඔබ මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේදී පාඨමාලාවේ විෂයන්ට අදාළ පෙළ පොත් ඔබ වෙත සපයනු ලැබේ. එම සියලුම මුද්‍රිත පොත් කියවීම අනිවාර්ය වන අතර දින පාසල් නොපවත්වන බව කරුණාවෙන් සලකන්න. ඔබට මතුවන අධ්‍යයන ගැටළු විසඳා ගැනීම සඳහා පාඨමාලා සම්බන්ධීකාරකගේ සහය ලබා ගැනීමට යොමු වන්න.

## 03. OUSL විද්‍යුත් තැපැල

OUSL සිසුන්ට විශ්වවිද්‍යාල ශිෂ්‍ය විද්‍යුත් තැපැල් ලිපින ලබාදෙයි. ශිෂ්‍ය විද්‍යුත් තැපැල් ලිපිනය ආරම්භ වන්නේ ශිෂ්‍ය අංකය (SID) සහ ousl.lk ලෙසටය.

උදා: s12007865@ousl.lk

දෙපාර්තමේන්තුව සහ අදාළ පාඨමාලා නායකයින් සමග සන්නිවේදනය කිරීමේදී ඔබ මෙම තැපැල් ගිණුම භාවිතා කළ යුතුය. (OUSL) ශිෂ්‍ය විද්‍යුත් තැපැල් සක්‍රිය කිරීමේ සබැඳිය පහත දක්වා ඇත.

https://reginfo.ou.ac.lk/letters/eGuide.pdf

ඔබට myOUSL හරහාද ප්‍රවේශ විය හැක (myOUSL පහසුකම භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳ 05 **(MYOUSL පහසුකම් භාවිතා කළ හැකි ආකාරය)** කොටස බලන්න.

## 04. SMS Alert සේවය

විශ්ව විද්‍යාලය විසින් පවත්වා ගෙන යනු ලබන කෙටි පණිවිඩ හුවමාරු සේවාවක් (SMS Alert Service) ඇත. එමගින් අවශ්‍යතාවය පරිදි කෙටි පණිවිඩ ඔබගේ ජංගම දුරකථනයට ලබා දීම සිදු කෙරේ. එමගින් තරුණ කටයුතු සංවර්ධන උසස් ඩිප්ලෝමා පාඪමාලාවට අදාළ අධ්‍යයන කටයුතු හා සම්බන්ධ කවර ආකාරයේ හෝ දැනුම්දීමක් සිදුකිරීමට නියමිත ය. එම කෙටි පණිවිඩ හුවමාරු සේවාව ලබා ගැනීමට ඔබගේ ජංගම දුරකතන අංකය විශ්වවිද්‍යාලයට (ඔබ ශිෂ්‍ය ලියාපදිංචිය සිදු කරන ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානයට) ලබා දිම අනිවාර්යය වේ. කිසියම් අවස්ථාවක දී එසේ ලබා දුන් ජංගම දුරකථන අංකය වෙනස් කිරීමට කල්පනා කරන්නේ නම් එය ද ලිඛිතව විශ්වවිද්‍යාලයේ අදාළ ශිෂ්‍ය ලියාපදිංචිය සිදු කරන ලද ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානයට ලබාදීම නොපමාව සිදු කළයුතු ය. එසේ නොකොට සිදුවන අපහසුතාවයන්ට විශ්වවිද්‍යාලය කිසිවිටෙකත් වග කියනු නොලැබේ.

## 05. MyOUSL පහසුකම් භාවිතා කළ හැකි ආකාරය

ශිෂ්‍යයන් පාඨමාලාවේ ලියාපදිංචි වු පසු MYOUSL පහසුකම් සඳහා ප්‍රවේශය ලබා ගත හැකි වේ. මෙය අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ඒ ඒ පාඨමාලාවට අදාළ විභාග හා වෙනත් විශේෂ දැනුම්දීම් පිළිබඳ තොරතුරු ශිෂ්‍යයන් සමග හුවමාරු කරන වෙබ් අඩවියක් බැවින් සෑම ශිෂ්‍යයෙක්ම අධ්‍යයන වැඩ කටයුතු පිලිබඳව යාවත්කාලින තොරතුරු ලබා ගැනීම සඳහා MYOUSL පහසුකම් ලබා ගත යුතු හා නිරන්තරයෙන් එම වෙබ් අඩවියට පිවිස තොරතුරු පරීක්ෂා කිරීම කළයුතු ය.

**විෂයයන් සඳහා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් ප්‍රාදේශීය මධ්‍යස්ථානවල නොමැති බැවින් සාමාන්‍ය දින පාසල් නොපැවැත්වෙන බව කරුණාවෙන් සලකන්න. නමුත් ඔබගේ පාඨමාලා හා සම්බන්ධ අධ්‍යයන කටයුතු සාකච්ඡා කිරීමට අපි Zoom සැසි හරහා ඔබව සම්බන්ධ කර ගන්නෙමු.**

MYOUSL පහසුකම ලබා ගැනීමට <u>පහත පියවරයන් අනුගමනය කරන්න.</u>

**01** පළමුව www.ou.ac.lk වෙබ් අඩවියට පිවිස "OUSL Home" මත ක්ලික් කරන්න.

**02** අනතුරුව "study" යනුවෙන් දක්වා ඇති කොටස ක්ලික් කිරීමෙන් අනතුරුව "Current Student" යටතේ ඇති MYOUSL සොයා ගන්න.

**03** MYOUSL ක්ලික් කරගෙන භාවිත නමක් (user name) සහ මුරපදය (Password) යොදන්න. පළමු වර ඇතුල් වීමේදී ඔබගේ භාවිත නම ශිෂ්‍ය වාර්තා පොතෙහි ඇතුළත් Sxxxxxx ලෙස දැක්වෙන ශිෂ්‍ය අංකය වන අතර මුරපදය ලෙසට ජාතික හැඳුනුම්පත් අංකය වේ. පසුව ඔබට අවශ්‍ය පරිදි රහස් අංකය වෙනස් කර ගත හැකිය.

## 06. අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණවලට අදාළ ලකුණු අන්තර්ජාලය මගින් ලබා ගන්නේ කෙසේද?

සෑම වර්ෂාර්ධයක් සඳහා නියමිත අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණවලට පෙනී සිට ඔබ විසින් ලබා ගන්නා ලද ලකුණු පදනම් කරගත් ශ්‍රේණීන් (Grades) මෙම අන්තර්ජාල (Online) පහසුකම මගින් පරීක්ෂා කර ගත හැකි ය. ඒ සඳහා ප්‍රවේශ වීමට පහත පියවර අනුගමනය කරන්න.

1. පළමුව www.ou.ac.lk වෙබ් අඩවියට පිවිස "Study" මත ක්ලික් කරන්න.
2. අනතුරුව "Current Students" යටතේ ඇති "MYOUSL" මත ක්ලික් කරන්න.
3. එවිට දිස්වන Search bar එකෙහි අදාළ පාඨමාලාවේ විස්තර (විෂය කේතය) උදාහරණයක් ලෙස DSD3504 ටයිප් කර ඔබගේ ප්‍රතිඵල පරීක්ෂා කර ගන්න.

## 07. අවසාන පරීක්ෂණවලට අදාළ ලකුණු අන්තර්ජාලය මගින් පරීක්ෂා කරගන්නේ කෙසේද?

ඔබගේ අවසන් පරීක්ෂණවලට අදාළ ප්‍රතිඵල පරීක්ෂා කර ගැනීම සඳහා ක්‍රම දෙකක් ඇත. එනම් එය MYOUSL පහසුකම සක්‍රීය කර ගැනීමෙන් හෝ සෘජුවම විශ්ව විද්‍යාල වෙබ් අඩවියට පිවිසීම මගිනි. ඒ අවස්ථාවන් පහත පරිදි තවදුරටත් විස්තර වේ.

- www.ou.ac.lk ක්ලික් කර විශ්ව විද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න. අනතුරුව එහි පහළ කොටසට ගොස් "Important Links" යටතේ ඇති "Exam Results" මත ක්ලික් කරන්න. ඔබගේ අවසන් පරීක්ෂණයේ නම සොයා ගෙන ඒ ඒ විෂයන්ට අදාළ විෂය කේතය ටයිප් කර ඔබගේ ප්‍රතිඵල පරීක්ෂා කර ගන්න.

❖වෙබ් අඩවියට පිවිසීම සඳහා පහත ලින්ක් එක මත ක්ලික් කරන්න.
https://ou.ac.lk/current-students/

## 08. අවසාන පරීක්ෂණය සඳහා ලියාපදිංචි වීම

සෑම ශිෂ්‍යයෙක්ම අන්තර්ජාලය මගින් අවසාන පරීක්ෂණය සඳහා ලියාපදිංචි විය යුතුය. අවසාන විභාගයට සති 03 කට පෙර MYOUSL හරහා සෑම ශිෂ්‍යයෙක්ම ලියාපදිංචි වීම අනිවාර්ය වේ. MYOUSL තුළ ඇති “Exam Registration” ලින්ක් එක ක්ලික් කිරීමෙන් ලියාපදිංචි වීම කළ හැකි ය. ඔබගේ විභාග ප්‍රවේශ පත්‍රය සකසනු ලබන්නේ ඔබ විභාගය සඳහා අයදුම් කළ විට පමණි. අප විශ්වවිද්‍යාලයේ විභාග අංශය විභාග ඇගයීම් සහ විභාග පැවැත්වීම සම්බන්ධ වගකීම දරන බැවින් ඔබ පහත කුමන හෝ අවස්ථාවකදී විභාග අංශය සම්බන්ධ කරගත යුතු ය.

- මාර්ගගත විභාග ප්‍රවේශ පත්‍රය සම්බන්ධ විමසීම්
- විභාග සම්බන්ධ ගැටලු
- ප්‍රතිඵල ලේඛන සහ සහතික පත්‍ර ඉල්ලීම් සම්බන්ධ කරුණු (ඒ සඳහා ඔබට නියමිත ගාස්තුවක් ගෙවීමට සිදුවනු ඇත).

# පළමුවන කොටස

# අධ්‍යයන උපදෙස්

## 09. පාඨමාලාව හැඳින්වීම

සමාජ අධ්‍යයන අංශය වෙනුවෙන් තරුණ කටයුතු සංවර්ධනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා පැමිණි ඔබ අපි සාදරයෙන් පිළිගනිමු. ඔබගේ අධ්‍යයන කටයුතුවල දී ඔබ විසින් අවධානයට ලක් කළ යුතු හා අනුගමනය කළ යුතු කරුණු පිළිබඳව මෙමගින් අවධානය යොමු කෙරේ.

තරුණ කටයුතු සංවර්ධනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ඔබ වෙත ගෙන එනු ලබන්නේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සමාජ විද්‍යා අංශය මඟිනි. මෙම වැඩසටහන ආරම්භයේදී ගෙන එනු ලැබුවේ පොදුරාජ්‍ය මණ්ඩලීය තරුණ වැඩසටහනේ ඒකාබද්ධතාවය මගිනි. මෙම ඩිප්ලෝමා පාඨමාලාව මගින් තරුණ පරපුරේ දක්ෂතා ඉහළ නැංවීම සහ ඔවුන් සංවර්ධනයේ කොටස් කරුවන් බවට පරිවර්තනය කිරීම අපේක්ෂා කෙරේ.

මෙම පාඨමාලාව අධ්‍යයන වර්ෂ දෙකකින් (03 වන මට්ටම සහ 04 වන මටට්ම) සමන්විත වන අතර සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි යන මාධ්‍ය තුනෙන්ම අධ්‍යයන කටයුතු කරගෙන යාමට අවස්ථාව ලබා දී ඇත. වර්ෂයක් තුළ සම්පූර්ණ කිරීමට ඇති සම්මාන අගය 30ක් වන අතර ඔබ විසින් සම්මාන 60ක් සහිතව පාඨමාලාව සාර්ථකව හැදෑරීමට සමත් වුවහොත් උසස් ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ලැබේ.

**තරුණ සංවර්ධන උසස් ඩිප්ලෝමා වැඩසටහන (2023/2024) අධ්‍යයන වර්ෂයේ සිට ක්‍රමානුකූලව ඉවත් කිරීමට නියමිතය. එබැවින්, ඔබ ඉහත අධ්‍යයන වර්ෂය තුළ දී වැඩසටහන සම්පූර්ණ කළ යුතුය.**

**ඉහත වැඩසටහන සම්පූර්ණ කළ පසු ඔබට තරුණ හා ප්‍රජා සංවර්ධන උපාධි පාඨමාලාව සඳහාලියාපදිංචි විය හැක. ඒ සඳහා ඔබට නිදහස් කිරීමේ සම්මාන 30ක් ලබා දෙනු ඇත.**

## 10. පාඨමාලා ව්‍යුහය (3 වන මට්ටම හා 4 වන මට්ටම)

**වගුව 01: තුන්වන මට්ටම (පළමු වසර) පළමු වර්ෂ අර්ධය සඳහා විෂයන්**

| විෂයන් | | සම්මාන ගණන | විෂය කේතය |
|---|---|---|---|
| 01 | ජනතාව සමග ඔවුන්ගේ ප්‍රජාවන් තුළ වැඩ කිරීම | 2 | DSD3207/ SSD1107 |
| 02 | පෞරුෂත්ව සංවර්ධනය සහ සන්නිවේදන කුසලතා | 3 | DSD3305/ SSD1105 |
| 03 | යෞවන සංවර්ධන කාර්යයන්හි පොදු රාජ්‍ය මණ්ඩලයේ සාරධර්ම | 5 | DSD3501/SSD1201 |
| 04 | ඉගෙනුම් ක්‍රියාවලිය | 5 | DSD3503/SSD1203 |

**වගුව 02: තුන්වන මට්ටම (පළමු වසර) දෙවන වර්ෂ අර්ධය සඳහා විෂයන්**

| විෂයන් | | සම්මාන ගණන | විෂය කේතය |
|---|---|---|---|
| 05 | ජනගහණය සහ පවුල් ජීවිත අධ්‍යාපනය | 2 | DSD3208/SSD1108 |
| 06 | කළමනාකරණ කුසලතා | 3 | DSD3306/SSD1106 |
| 07 | තරුණ පෙළ සහ සමාජය | 5 | DSD3502/SSD1202 |
| 08 | තරුණ කටයුතු සංවර්ධනය පිළිබඳ මූලධර්ම සහ ව්‍යවහාර | 5 | DSD3504/SSD1204 |

**වගුව 03: හතරවන මට්ටම (දෙවන වසර) පළමු වර්ෂ අර්ධය සඳහා විෂයන්**

| විෂයන් | | සම්මාන ගණන | විෂය කේතය |
|---|---|---|---|
| 09 | ව්‍යවසායකත්ව කටයුතු ප්‍රවර්ධනය සහ ආර්ථික සංවර්ධනය | 2 | DSD4205/ SSD2105 |
| 10 | තිරසාර සංවර්ධනය සහ පරිසරය | 3 | DSD4304/ SSD2104 |
| 11 | ව්‍යාපෘති සැලසුම්කරණය, අධීක්ෂණය හා ඇගයීම | 5 | DSD4502/ SSD2202 |
| 12 | ක්‍රියාකාරී පර්යේෂණය (පාඨමාලාව ඇසුරින් වචන 6000 කින් සමන්විත ස්වාධීන නිබන්ධනය) | 5 | DSD4508/ SSD2208 |

**වගුව 04: හතරවන මට්ටම (දෙවන වසර) දෙවන වර්ෂ අර්ධය සඳහා විෂයන්**

| විෂයන් | | සම්මාන ගණන | විෂය කේතය |
|---|---|---|---|
| 13 | තාරුණ්‍ය හා සෞඛ්‍යය | 2 | DSD4207/ SSD2107 |
| 14 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සංවර්ධනය | 3 | DSD4306/ SSD2106 |
| 15 | ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම | 5 | DSD4501/ SSD2201 |
| 16 | ගැටුම් නිරාකරණය පිළිබඳ උපාය මාර්ග | 5 | DSD4503/ SSD2203 |

## 11. අප සමඟ සම්බන්ධ විය හැකි ආකාරය

සමාජ අධ්‍යයන දෙපාර්තමේන්තුව ඔබගේ අධ්‍යයන කටයුතු සම්බන්ධව ඇති වන ඕනෑම ගැටලුවකදී (මුද්‍රිත පොතපත, පැවරුම්, අවසාන පරීක්ෂණය යනාදීය සම්බන්ධ) ඔබට සහයදීමට බැඳී සිටී. ඔබගේ වැඩසටහනට සම්බන්ධ ඕනෑම ගැටලුවකදී උපකාර ලබා ගැනීම සඳහා පහත තොරතුරු පරිදි පාඨමාලා සම්බන්ධීකාරක හා සම්බන්ධ වන්න.



**පාඨමාලා සම්බන්ධීකාරක,**
**තරුණ කටයුතු සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**
**සමාජ අධ්‍යයන අංශය**
**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**
**නාවල, නුගේගොඩ.**
**දු.ක :** 0112881083 / 0112881417 / **0112881033**
**විද්‍යුත් තැපැල :** hmuhe@ou.ac.lk
rgobi@ou.ac.lk

## 12. විෂය ඇගයීම් ක්‍රමය (Course Evaluation Method)

ඔබගේ අධ්‍යාපන කටයුතු ඇගයීම් ආකාර දෙකකින් (02) සිදු වේ.

1. අඛණ්ඩ ඇගයීම් ක්‍රම (Continuous Assessments – CAs)
2. අවසාන විභාග (Final Examinations)

### 12.1 අඛණ්ඩ ඇගයීම් ක්‍රම (Continuous Assessments (CAs)

අඛණ්ඩ ඇගයීම් ක්‍රම යනු ස්වයං අධ්‍යාපනය සඳහා පුමුඛත්වය දෙන විවෘත විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්‍රමය තුළ හඳුන්වා දී ඇති සුවිශේෂී අධ්‍යයන ක්‍රමවේදයකි. අවසන් විභාගය සඳහා සුදුසුකම් ලැබීමට නම් සිසුවා අඛණ්ඩ ඇගයීම් සියල්ලම සම්පූර්ණ කළ යුතු ය. එසේ සාර්ථකව අඛණ්ඩ ඇගයීම් සම්පූර්ණ කිරීම ඉහළ ලකුණු ලැබීමට ද හේතු වේ. ඔබගේ අවසන් ලකුණු ගණනය කිරීමේ දී 50% ක් වූ ප්‍රතිශතයක් අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණවලින් ලබා ගැනේ. ඒ ඒ විෂයන්හි සම්මාන අගය අනුව ඔබ විසින් සම්පූර්ණ කළ යුතු අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණ පිළිබඳව පහතින් දැක්වේ.

**සම්මානවල වටිනාකම දෙකක් හෝ තුනක් වන විෂයන් සඳහා**

1. නිවසේදී සකසා එවිය යුතු පැවරුම් සහ සම්මුඛ පරීක්ෂණ (TMA,Viva)
2. ඉගෙනුම් ජර්නලය (Learning Journal – LJ)

**<u>සම්මානවල වටිනාකම පහක් වන විෂයන් සඳහා</u>**

1. නිවසේදි සකසා එවිය යුතු පැවරුම් සහ සම්මුඛ පරීක්ෂණ (TMA I,Viva)
2. නිවසේදි සකසා එවිය යුතු පැවරුම් (TMA II)
3. ඉගෙනුම් ජර්නලය (Learning Journal - LJ)

### 12.1.1 නිවසේදි සකසා එවිය යුතු පැවරුම් (TMA I & II)

සිසුන් ,සම්මාන 5ක් ඇති පාඨමාලා සඳහා TMA I සහ II යනුවෙන් පැවරුම් 2 ක් ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ කරන ලද TMA නියමිත දිනට පෙර ඇගයීම සඳහා ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා වන ප්‍රශ්න ඔබේ අදාළ පාඨමාලා මෙවලම් මත පදනම් වේ. ඉදිරිපත් කිරීමේ කාලසීමාවන් සපුරාලන ලෙස ඔබට දැඩි ලෙස උපදෙස් දෙනු ලැබේ. **නියමිත දිනට පසුව පැවරුම් පිළිගනු නොලැබේ.** එබැවින්, "කාල කළමනාකරණය" පිළිබඳ සැලකිලිමත් වීම ඔබේ යහපතට හේතු වනු ඇත. ඒ සඳහා ලබාගත් ලකුණු අවසාන තක්සේරුව සඳහා සලකා බලනු ලැබේ. කරුණාකර මාර්ගෝපදේශයේ **"ඔබේ (TMA) ඉදිරිපත් කරන්නේ කෙසේද"** යන පරිශීලනය කරන්න.

**සැ.යු: අවසන් විභාගයට සුදුසුකම් (Eligibility) ලබා ගැනීම සඳහා සියලුම අඛන්ඩ ඇගයීම් සම්පූර්ණ කළ යුතු අතර එම ලකුණුවල සාමාන්‍යය අගය 40% පවත්වාගෙන යෑම ද අනිවාර්යය වේ. එසේ වුවහොත් පමණක් එම ලකුණු අවසන් ලකුණුවලට එකතු කරනු ලැබේ.**

### 12.1.2 ඉගෙනුම් ජර්නලය (Learning Journal (CA II))

සම්මාන අගය 02, 03 හා 05 යන සියලුම විෂයන් සඳහා එක් ඉගෙනුම් ජර්නලය බැගින් සම්පූර්ණ කිරීමට ඇත. එනම් මෙම ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඔබ විසින් හදාරන සෑම විෂයක් සඳහාම එක් ඉගෙනුම් ජර්නලයක් පවත්වා ගත යුතුය යන්නයි. ඉගෙනුම් ජර්නලයක් සකස් කිරීමේ දී එදිනෙදා අධ්‍යයන කටයුතුවලට අදාළව තබා ගන්නා පාඩම් සටහන් සහ වාර්තාවන් ද ඇතුළත් කළ හැකි ය. ඊට අමතරව මොඩියුලයන් තුළ දැක්වෙන ක්‍රියාකාරකම් වලට පිළිතුරු සැපයීම ද අරමුණු කර ගත හැකිය. දී ඇති කාලසීමාව අනුව යමින් සම්පූර්ණ කරන ලද ජර්නලය ඇගයීම සඳහා භාරදිය යුතු ය. එමෙන් ම සෑම මොඩියුලයක් තුළම දී ඇති ක්‍රියාකාරකම් කොටස් අවබෝධයෙන් කියවීම මගින් ද ඔබට ඉගෙනුම් ජර්නලය පිළිබඳව තවදුරටත් උගත හැකිය. ඔබ විසින් සාර්ථකව සම්පූර්ණ කරන ලද ඉගෙනුම් ජර්නලයකට උපයා ගන්නා ලද ලකුණු අවසාන ඇගයීමට එකතු වේ.

ඉගෙනුම් ජර්නලය ක්ෂේත්‍ර 03 ක් යටතේ ඇගයීමට ලක් වේ. එනම්
(අ) දැනුම ඇගයීම
(ආ) කුසලතා ඇගයීම
(ඇ) විවරණාත්මක කියවීම වශයෙනි.

කරුණාකර "ප්‍රත්‍යාවර්තීය ඉගෙනුම් සඟරාව (Learning Journal) ලිවීම" පිළිබඳ මාර්ගෝපදේශ සහ "ඔබේ ඉගෙනුම් සඟරාව ඉදිරිපත් කරන්නේ කෙසේද" පිළිබඳ මාර්ගෝපදේශ බලන්න.

කරුණාකර වීඩියෝව බලන්න.

| https://www.youtube.com/watch?v=60rX6jOdcMY |
|---|

### 12.2 අවසන් විභාගය (Final Examination)

අවසාන විභාග සෑම අධ්‍යයන වාරයක් අවසානයේම පවත්වනු ලැබේ. ඔබේ අවසාන විභාග සඳහා අයදුම් කිරීමට අවශ්‍ය බව මතක තබා ගන්න. (MYOUSL) හරහා ඔන්ලයින් අයදුම් කළ හැක. අවසාන විභාගවල සෑම ප්‍රශ්න පත්‍රයක්ම පැය දෙකක (02) කාල සීමාවකින් යුක්ත වේ. ඔබේ (CA) සඳහා ඔබ ලබා ගන්නා ශ්‍රේණි නොසලකා ඔබට අවසාන විභාගය සඳහා අයදුම් කළ හැකිය. කෙසේ වෙතත්, අවසාන විභාග ලකුණු සලකා බලනු ලබන්නේ ඔබ CA වෙතින් අවශ්‍ය අවම සාමාන්‍යය ලබා ගන්නේ නම් පමණි.

ඔබට ඔබේ අවසන් විභාගයට පෙනී සිටීමට නොහැකි නම් සහ ඔබේ අඛණ්ඩ ඇගයීම් (CA) සඳහා ඔබ සාමාන්‍ය (40)ක් ලබාගෙන ඇත්නම්, ඔබේ CA ලකුණු ඊළඟ අධ්‍යයන වර්ෂය දක්වා ඉදිරියට ගෙන යාමට ඔබට අවසර ලැබේ. ඔබේ CA 40 ට වඩා අඩු නම්, එනම් C ශ්‍රේණියට වඩා අඩු නම්, ඔබට අසමත් ශ්‍රේණියක් (FA) ලබා දෙන අතර ඊළඟ වසරේ දී පාඨමාලාව සඳහා නැවත ලියාපදිංචි වීමට අවශ්‍ය වනු ඇත. ඔබ පාඨමාලාවක් සඳහා නැවත ලියාපදිංචි වූ විට මූල්‍යමය බලපෑම් ඇති වන අතර, ශ්‍රේණිය C ට සීමා වේ. එබැවින් අඛණ්ඩ ඇගයීම් බැරෑරුම් ලෙස සලකන ලෙස සිසුන්ට උපදෙස් දෙනු ලැබේ.

## 13. ලකුණු ඇගයීමේ ක්‍රමය (සමස්ත අඛණ්ඩ ඇගයීම් ලකුණු (OCAM))

### OCAM <u>සඳහා ලකුණු ඇගයීමේ ක්‍රමය (සම්මාන 2 සහ 3 වන විෂයයන් සඳහා)</u>

සෑම සම්මාන (2) හා (3) විෂයන් සඳහා එක් පැවැරුමක් සහ එක් ඉගෙනුම් සඟරාවක් බැගින් ඉදිරිපත් කළ යුතුය. සියල්ලන්ගේම සාමාන්‍ය ලකුණු බව කරුණාවෙන් සලකන්න.

CA ලකුණු ගණනය කිරීම සඳහා තක්සේරු සංරචක දෙකක් (02) සලකා බලනු ලැබේ. යම් පාඨමාලාවක එක් එක් CA සංරචක සමත් වීමට ඔබ අවම වශයෙන් 40%ක් ලබා ගත යුතුය. කලින් සඳහන් කළ පරිදි, ඔබේ අවසාන ශ්‍රේණියෙන් (50%) ඔබේ CA ලකුණු වලින් ගණනය කෙරේ.

### OCAM <u>සඳහා ලකුණු ඇගයීමේ ක්‍රමය (සම්මාන 5 වන විෂයයන් සඳහා)</u>

සම්මාන (5) විෂයන් සඳහා ඔබ එක් ටියුටර් ලකුණු කළ පැවරුම් දෙකක් (TMA) සහ එක් ඉගෙනුම් සඟරාවක් (LJ) බැගින් ඉදිරිපත් කළ යුතුය. (CA) ලකුණු ගණනය කිරීම සඳහා ඇගයීම් කොටස් තුනේම (03) සාමාන්‍ය ලකුණු සලකා බලන බව කරුණාවෙන් සලකන්න. ඔබ CA සංරචක දෙකක් සඳහා අවම වශයෙන් (40%) ක් සහ තුන්වන CA සංරචකයෙන් (30%) ක් ලබා ගත යුතුය. ඉහත සඳහන් කළ පරිදි, ඔබේ අවසාන ශ්‍රේණියෙන් (50%) ඔබේ CA ලකුණු වලින් ගණනය කෙරේ.

**<u>අවසන් ලකුණු ශ්‍රේණිගත කිරීම</u>**

අවසන් ලකුණු ශ්‍රේණිගත කිරීම පහත පරිදි වේ.

අඛණ්ඩ ඇගයීම් ලකුණු - 50% (සියලුම අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණවල සාමාන්‍ය අගය 50%)

අවසාන විභාග ලකුණු - 50%
සමස්ත ලකුණු ශ්‍රේණිගත කිරීම - 100%

සැ.යු : ඔබ විසින් හදාරන එක් විෂයකට අදාළ අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණ සඳහා ලබා ගත යුතු 50% ලකුණු මුළු ලකුණු සඳහා එකතුවීමට නම් එම විෂය සඳහා අවසන් විභාගයේදී අඩුම වශයෙන් 40% ක් ලබා ගත යුතුය. එමෙන්ම ඔබ අසමත්වන අවසන් පරීක්ෂණයක් නැවතත් ඊලඟ අධ්‍යයන වර්ශය තුළ දී සම්පූර්ණ කිරීමට නම් ඒ සඳහා අවසර ලැබෙනුයේ ඔබගේ අඛණ්ඩ ඇගයීම් ලකුණුවල සාමාන්‍ය අගය 40% ක් වන්නේ නම් ය. එසේම සමස්ත අඛණ්ඩ ඇගයීම් සඳහා 40% ක් වත් ලකුණු ලබා ගැනීමට අසමත් වන අයෙක් සඳහා එම විෂය නැවත හැදෑරීමට සිදු වන අතර ඒ සඳහා ඉදිරි වර්ෂ දෙකේ සිට තුන දක්වා කාලය දීර්ඝ කිරීමක් ද කරනු ලැබේ.

**මා CA සාමාර්ථ ලබා ගන්නා වර්ෂයේ අවසාන විභාගවලින් අසමත් වුවහොත් හෝ අවසන් විභාගවලට පෙනී නොසිටින්නේ නම් මට මගේ CA ලකුණු ඉදිරියට ගෙන යා හැකිද?**

**ඔව්. නමුත් CA ලකුණු ඉදිරියට ගෙන යා හැකි වන්නේ වසරක් සඳහා පමණයි.**
**එම වර්ෂයෙන් පසු ඔබගේ CA ළකුණු වලංගු නොවන අතර ඔබ නැවත ඊළඟ වසර තුළ සම්පූර්ණ පාඨමාලාව සඳහා ලියාපදිංචි විය යුතුය.**

## 14. ඇගයීම් ලකුණු ශ්‍රේණිගත කිරීම (The Grading System)

**වගුව 5: ඇගයීම් ලකුණු සහ ඊට අදාළ ශ්‍රේණියන්**

| Range of Marks Z% | Grade | Grade point value 0.00 |
|---|---|---|
| 85-100 | A+ | 4.00 |
| 75-84 | A | 4.00 |
| 70-74 | A- | 3.70 |
| 63-69 | B+ | 3.30 |
| 55-62 | B | 3.00 |
| 50-54 | B- | 2.70 |
| 45-49 | C+ | 2.30 |
| 40-44 | C | 2.00 |
| 35-39 | C- | 1.70 |
| 30-34 | D+ | 1.30 |
| 20-29 | D | 1.00 |
| 0-19 | E | 0.00 |
| ඔබේ OCAM ලකුණු 40 ට වඩා අඩු වූ විට | FA | |
| ඔබ අවසන් විභාගය අසමත් වූ විට | RX | |

**A+, A, A-, B+, B, B-, C+** සහ C සමත් ශ්‍රේණි වලින් සමන්විත වේ.

# දෙවන කොටස

# අඛණ්ඩ ඇගයීම් සඳහා කාලසටහන් පිළිබඳ උපදෙස්

**15.** අඛණ්ඩ ඇගයීම් **(CA)** විභාග කාලසටහන - තුන්වන මට්ටම

**වගුව 06 - අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය භාරදීමේ අවසන් දිනය (තුන්වන මට්ටම - පළමු වර්ෂ අර්ධය)**

| විෂය කේතය | පාඨමාලාවේ නම | භාරගන්නා අවසාන දිනය | | |
|---|---|---|---|---|
| DSD3503/SSD1203 | ඉගෙනුම් ක්‍රියාවලිය | **TMA I** | 08/08/2023 | ප.ව 3.00 ට හෝ ඊට පෙර |
| | | TMA II | 02/09/2023 | ප.ව 3.00 ට හෝ ඊට පෙර |
| | | LJ | 23/09/2023 | |
| DSD3305/SSD1105 | පෞරුෂත්ව සංවර්ධනය සහ සන්නිවේදන කුසලතා | **TMA** | 08/08/2023 | ප.ව 3.00 ට හෝ ඊට පෙර |
| | | LJ | 02/09/2023 | |
| DSD3501/SSD1201 | යෞවන සංවර්ධන කාර්යයන්හි පොදු රාජ්‍ය මණ්ඩලයේ සාරධර්ම | **TMA I** | 08/08/2023 | ප.ව 3.00 ට හෝ ඊට පෙර |
| | | TMA II | 02/09/2023 | ප.ව 3.00 ට හෝ පෙර |
| | | LJ | 23/09/2023 | |
| DSD3207/SSD1107 | ජනතාව සමග ඔවුන්ගේ ප්‍රජාවන් තුළ වැඩ කිරීම | **TMA** | 08/08/2023 | ප.ව 3.00 ට හෝ ඊට පෙර |
| | | LJ | 02/09/2023 | |
| 30 /10/2023 | | **සමස්තයක් වශයෙන්, (OCAM) ලකුණු නිකුත් කරනු ලැබේ.** | | |
| 30 /09/2023-30/10/2023 | **අවසාන විභාගය සඳහා මාර්ගගත අයදුම්පත** | | | |
| 18/11/2023-23/12/2023 | **අවසන් පරීක්ෂණ පැවැත්වීම** | | | |
| මාස තුනක් ඇතුළත (30.03.2024 ට පෙර) | **අවසන් ප්‍රතිඵල නිකුත් කිරීම** | | | |

## 16. වාර්ෂික ඉගෙනුම් දින දර්ශනය : තුන්වන මට්ටම

වගුව 07: වාර්ෂික ඉගෙනුම් දින දර්ශනය - 03 වන මට්ටම (2023/2024)

| Course Code | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තොම්බර් | නොවැම්බර් | දෙසැම්බර් | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DSD3503<br>SSD1203 | - | TMA I | TMA II<br>LJ | - | FE | - | - | - | - | - | - |
| DSD3305<br>SSD1105 | - | TMA I | LJ | - | FE | - | - | - | - | - | - |
| DSD3501<br>SSD1201 | - | TMA I | TMA II<br>LJ | - | FE | - | - | - | - | - | - |
| DSD3207<br>SSD1107 | - | TMA I | LJ | - | FE | - | - | - | - | - | - |
| DSD3502<br>SSD1202 | - | - | - | - | - | - | - | - | - | - | - |
| DSD3306<br>SSD1106 | - | - | - | - | - | - | - | - | - | - | - |
| DSD3504<br>SSD1204 | - | - | - | - | - | - | - | - | - | - | - |
| DSD3208<br>SSD1108 | - | - | - | - | - | - | - | - | - | - | - |

**TMA = නිවසේදී සකසා එවිය යුතු පැවරුම්** **LJ = ඉගෙනුම් ජර්නලය** **FE = අවසාන පරීක්ෂණය**

**දෙවන අධ්‍යයන වාරයට අදාළ කාලසටහන පළමු අධ්‍යයන වාරය අවසානයේ නිකුත් කෙරේ**

## 17. අඛණ්ඩ ඇගයීම් (CA) විභාග කාලසටහන - හතරවන මට්ටම

**වගුව 08 - අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය සඳහා අවසන් දින (හතරවන මට්ටම - පළමු වර්ෂ අර්ධය)**

| විෂය කේතය | විෂය | ඉදිරිපත් කිරීම සඳහා නියමිත දිනය | | |
|---|---|---|---|---|
| SSD2208/ DSD4508 | නිබන්ධනය | TMA I * | 05/08/2023 | ප.ව 3.00 ට හෝ ඊට පෙර |
| | | TMA II | 27/08/2023 | ප.ව 3.00 ට හෝ ඊට පෙර |
| | | LJ | 25/09/2023 | |
| SSD2105/ DSD4205 | ව්‍යවසායකත්ව කටයුතු ප්‍රවර්ධනය සහ ආර්ථික සංවර්ධනය | TMA I* | 05/08/2023 | ප.ව 3.00 ට හෝ ඊට පෙර |
| | | LJ | 25/09/2023 | |
| SSD2202/ DSD4502 | ව්‍යාපෘති සැලසුම්කරණය, අධීක්ෂණය හා ඇගයීම | TMA I* | 05/08/2023 | ප.ව 3.00 ට හෝ ඊට පෙර |
| | | TMA II | 27/08/2023 | ප.ව 3.00 ට හෝ ඊට පෙර |
| | | LJ | 25/09/2023 | |
| SSD2104/ DSD4304 | තිරසාර සංවර්ධනය සහ පරිසරය | TMA I* | 05/08/2023 | ප.ව 3.00 ට හෝ ඊට පෙර |
| | | LJ | 25/09/2023 | |
| 30 /10/2023 | | **සමස්ත අඛණ්ඩ ඇගයීම් ලකුණු නිදහස් කිරීම:** | | |
| 30 /09/2023-30/10/2023 | | **අවසන් පරීක්ෂණ සඳහා අයදුම් කිරීම (අන්තර්ජාලය මගින්)** | | |
| 18/11/2023-23/12/2023 | | **අවසන් පරීක්ෂණ පැවැත්වීම** | | |
| මාස තුනක් ඇතුළත (30.03.2024 ට පෙර) | | **අවසන් ප්‍රතිඵල නිකුත් කිරීම** | | |
| **පර්යේෂණ වාර්තාව සඳහා අවසාන දිනය** | | **අවසාන විභාගයට මාසයකට පෙර** | | |
| | | | | |

*

**සැ.යු: සියලුම පැවරුම් සහ ඉගෙනුම් සඟරාව ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය හරහා ඉදිරිපත් කළ යුතුය.**

**පාඨමාලා සම්බන්ධීකාරක,**
**තරුණ කටයුතු සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව,**
**සමාජ අධ්‍යයන අංශය,**
**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය,**
**නාවල, නුගේගොඩ.**

## 18. වාර්ෂික ඉගෙනුම් දින දර්ශනය : 04 වන මට්ටම

වගුව 09 : වාර්ෂික ඉගෙනුම් දින දර්ශනය - 04 වන මට්ටම (2023/2024)

| විෂය ක්ෂේත්‍රය | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තොම්බර් | නොවැම්බර් | දෙසැම්බර් | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **DSD450<br>SSD2208** | - | **TMA I<br>TMA II** | **LJ** | - | **FE** | - | - | - | - | - | - |
| **DSD4205<br>SSD2105** | - | **TMA I** | - | - | **FE** | - | - | - | - | - | - |
| **DSD4502<br>SSD2202** | - | **TMA II** | **LJ** | - | **FE** | - | - | - | - | - | - |
| **DSD4304<br>SSD2104** | - | **TMA I** | - | - | **FE** | - | - | - | - | - | - |
| **DSD4503<br>SSD2203** | - | - | - | - | - | - | - | - | - | - | - |
| **DSD4207<br>SSD2107** | - | - | - | - | - | - | - | - | - | - | - |
| **DSD4501<br>SSD2201** | - | - | - | - | - | - | - | - | - | - | - |
| **DSD4306<br>SSD2106** | - | - | - | - | - | - | - | - | - | - | - |

**නිවසේදි සකසා එවිය යුතු පැවරුම් (TMA)   ඉගෙනුම් ජර්නලය (LJ)   අවසාන පරීක්ෂණය (FE)**

**දෙවන අධ්‍යයන වාරයට අදාළ කාලසටහන පළමු අධ්‍යයන වාරය අවසානයේ නිකුත් කෙරේ**

## 19. ඔබේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාව (2023/2024)

කරුණාකර ඔබේ කාර්ය සාධනය (ශ්‍රේණි) පිළිබඳ වාර්තාවක් තබා ගන්න

**පළමු වර්ෂ අර්ධය**

| | විශය කේතය | CAT I | CAT II | CAT III | වෙනත් (තිබේනම්) | අවසාන පරීක්ෂණය |
|---|---|---|---|---|---|---|
| 01 | DSD | | | | | |
| 02 | DSD | | | | | |
| 03 | DSD | | | | | |
| 04 | DSD | | | | | |

** 2024/2025 අධ්‍යයන වර්ශයේ ලියාපදිංචිය සදහා එනවිට මෙම ශිෂ්‍ය වාර්තා පොත රැගෙන එන්න.

**දෙවන වර්ෂ අර්ධය**

| | විශය කේතය | CAT I | CAT II | CAT III | වෙනත් (තිබේනම්) | අවසාන පරීක්ෂණය |
|---|---|---|---|---|---|---|
| 01 | DSD | | | | | |
| 02 | DSD | | | | | |
| 03 | DSD | | | | | |
| 04 | DSD | | | | | |

## 20. සියලු ක්‍රියාකාරකම් වලට අදාළ දින සටහන

**පළමු වර්ෂ අර්ධය**

**සියලු ක්‍රියාකාරකම් පහත වගුව තුළ සටහන්කර තබාගන්න.**

| | විෂය ක්ෂේත්‍රය * | CAs සඳහා අවසාන දිනය | | | | අවසාන විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය |
|---|---|---|---|---|---|---|
| | | TMA 1 | TMA 2 | Learning Journal | ව්‍යාපෘති වාර්තාවට අදාළ යෝජනාව හා අවසන් ව්‍යාපෘති වාර්තා | |
| 01 | DSD | | | | | |
| 02 | DSD | | | | | |
| 03 | DSD | | | | | |
| 04 | DSD | | | | | |
| | | | | | | 30/10/2023 |
| 01 | DSD | | | | | |
| 02 | DSD | | | | | |
| 03 | DSD | | | | | |
| 04 | DSD | | | | | |

ලියාපදිංචි වීමෙන් අනතුරුවද ඔබට තවත් පාඨමාලා කිහිපයක් එක් කිරීමට අවසර ඇති බව කරුණාවෙන් සලකන්න. එවැනි සිසුන් තම ඉල්ලීම කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය. adcol@ou.ac.lk.

* අදාළ විෂය ක්ෂේත්‍රයන් තෝරාගෙන ඊට අදාළ සටහන් පමණක් ඇතුළත් කරන්න.

**නව විෂයන් එක් කිරීමට අදහස් කරන්නේනම් පමණක් 2023 ජූලි 14 වැනි දින ඔබට අවසර ඇති අතර ඒ සඳහා ජූලි මස (12) දින හෝ එදිනට පෙර අයදුම්කළ යුතු බව කරුණාවෙන් සලකන්න.

තවද, ලබාගත් විෂයන් වලින් කොටසක් අත්හැරීමට අදහස් කරන්නේනම් පමණක් (Drop) 2023 ජූලි 21 වැනි ඔබට අවසර ඇති අතර ඒ සඳහා ජූලි මස 18 දින හෝ එදිනට පෙර අයදුම්කළ යුතුය.

## 21. උපදේශන පත්‍රිකාව (Counselling Form)

**COUNSELLING FORM**
**Courses to be offered/exempted 2023/2024**
**Programme: Higher Diploma in Youth Development Level 3 & 4**

Reg. No.: …..................... Centre: …............................... E-mail Address:…………………

Name:…....................................................................................................................

Address:…...............................................................................................................

…………………………………………………………………………………………………….

Tel. No: …………………………… WhatsApp number……………………….

*Please refer to your previous results and indicate all the results you have obtained up to now.

*All FA grades should be marked under offered courses.

## Level 3

**1st SEMESTER**

| COURSE CODE | COURSE TITLE | Previous result | Offered |
|---|---|---|---|
| DSD3207/SSD1107 | Working with People in their Communities | | |
| DSD3305/SSD1105 | Personality Development and Communication Skills | | |
| DSD3501/SSD1201 | Commonwealth Values in Youth in Development Work | | |
| DSD3503/SSD1203 | Learning Process | | |

**2nd SEMESTER**

| COURSE CODE | COURSE TITLE | Previous result | Offered |
|---|---|---|---|
| DSD3208/SSD1108 | Population and Family Life Education | | |
| DSD3306/SSD1106 | Management Skills | | |
| DSD3502/SSD1202 | Young People and Society | | |
| DSD3504/SSD1204 | Principles and Practices of Youth In Development Work | | |

## Level 4

**1st SEMESTER**

| COURSE CODE | COURSE TITLE | Previous result | Offered |
|---|---|---|---|
| DSD4205/SSD2105 | Promoting Enterprise and Economic Development | | |
| DSD4304/SSD2104 | Sustainable Development and Environment | | |
| DSD4502/SSD2202 | Project Planning, Monitoring and Evaluation | | |
| DSD4508/SSD2208 | Action Research | | |

**2nd SEMESTER**

| COURSE CODE | COURSE TITLE | Previous result | Offered |
|---|---|---|---|
| DSD4207/SSD2107 | Youth and Health | | |
| DSD4306/SSD2106 | Gender and Development | | |
| DSD4501/SSD2201 | Policy Planning and Implementation | | |
| DSD4503/SSD2203 | Conflict Resolution: Strategies and Skills | | |

Student's Signature:……………………Date:………………………

Name of the Counselor:………………………..Signature of the counselor:…………….

## 22. පරිපාලනමය ගැටලු විසඳා ගැනීම සඳහා විමසීම් කිරීම

අධ්‍යයන කාලය තුළදී ඔබට ඇතිවන පරිපාලනමය ගැටලු සම්බන්ධයෙන් තොරතුරු ලබා ගත යුතු ආකාරය පහත දැක්වේ. දුරකථන මගින් හෝ ලිපි මගින් එම විමසීම් කළ හැකිය.

**වගුව 10: අධ්‍යයන ආධාරක අංශවල සම්බන්ධතා තොරතුරු**

| NATURE OF PROBLEM | WHOM TO CONTACT | DIVISION |
|---|---|---|
| IT Help Desk | ithelpdesk@ou.ac.lk | 0112 881 378 / 0112 881 055<br>0716 368 180 / 070 1235 776 |
| Registration, Studentship, Change of Centre and name | Assistant Director<br>Colombo Regional Centre | **Colombo Regional Centre**<br>OUSL, Nawala, Nugegoda.<br>011288142/380 |
| Withdrawal from a Programme | Assistant Director (CRC) with copy to Head/Dept. of Social Studies | **Colombo Regional Centre**<br>OUSL, Nawala, Nugegoda.<br>011288142/380 |

| | | |
|---|---|---|
| Final Examination results, Certificates | Senior Assistant Registrar | **Examination Division**, OUSL, Nawala, Nugegoda. 011-2881350/0716 368 207 https://ou.ac.lk/exam-result/ |
| Schedule of Day Schools | Course Coordinator/Lecturer/ Relevant Regional Coordinator | **Dept. of Social Studies** **Relevant Regional Centre** 011 2881083/300/417/ |
| Any other course related problems | Course Coordinator /Lecturer/Relevant Regional Coordinator | **Dept. of Social Studies**, Faculty of HSS, OUSL, Nawala, Nugegoda. 011 2881-083/300/417/014 |
| CAT Results | The OUSL website | •http://www.ou.ac.lk •Click on "Study" •Select "Current students" •To search final results Click on EXAM RESULTS (Enter course code to search) To search CAT results Click on MYOUSL |
| Collecting course materials | Officer, Dispatch Centre of your respective Regional/Study Centre | **Dispatch Centre,** Relevant Regional/Study Centre 011 2881376 / 0701235770 (Colombo) |

| | | |
|---|---|---|
| Course content | Course Coordinator/ Lecturer | **Dept. of Social Studies,** Faculty of HSS, OUSL, Nawala, Nugegoda. 011 2881417 (Office Staff) |
| CE Courses | Coordinator/EGAP | 0112881083 |
| | Carrier Guidance Unit | 0112881049 |
| Student Affairs | Assistant Registrar | 0716 368 196 |
| Exam Division | Assistant Registrar | 0716 368 207 |
| Finance Division | Assistant Bursar | 0716 368 232 |
| Library | Assistant Librarian | 0716 368 232 |
| Faculty of Humanities & Social Sciences | Quality Assurance Coordinator | 0716 368 241 |
| Students' Affair Division | - | https://ou.ac.lk/stuwelfare-divi/ |
| Leaner support division | - | https://ou.ac.lk/learner-support/ |
| OUSL Counselling Unit | Counsellors | 0112881361 / 0702510820 counsellor@ou.ac.lk |
| Temporary Residential Facility | - | https://ou.ac.lk/trf/ |

**වගුව 11: ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන භාර නිලධාරීන් පිළිබඳ විස්තර**

| Centres | Officers | Postal Address & Email Address | Contact Number |
|---|---|---|---|
| Central Dispatch Unit (Book distribution Centre) | | | 070-1235770 |
| Colombo | Ms. W.K.R. Sadeesha<br>Ms. U.H.B.V.P. Angammana<br>(Assistant Director) | OURC, Nawala, Nugegoda.<br>adcol@ou.ac.lk | 011-2853930<br>070-6215108 |
| Kandy | Mr. Anushka Bandara<br>(Assistant Director) | OURC, Polgolla, Kandy.<br>adkan@ou.ac.lk | 081-2499370<br>070-6215114 |
| Jaffna | Mr. K. Kanthavel<br>(Assistant Director) | OURC, Browns Road, Kokuvil, Jaffna.<br>adjaf@ou.ac.lk | 021-2223374<br>070-6215112 |
| Anuradhapura | Ms. Shayama Madugalle<br>(Assistant Director) | OURC, Jayanthi Mawatha, (Depot Area) Anuradhapura<br>adanu@ou.ac.lk | 025-2222871<br>070-6215104 |
| Batticaloa | Mr.A.D Kamalanathan<br>(Assistant Director) | OURC, No.23, New Road. Batticaloa.<br>adbat@ou.ac.lk | 065-2222264<br>070-6125107 |
| Matara | Mr. G. Dinesh<br>(Assistant Director) | OURC, Nupe, Matara.<br>admat@ou.ac.lk | 041-2222943<br>070-6215121 |
| Kurunegala | Mr.M. B. Sakalasooriya<br>(Assistant Director) | OURC, Negombo Road, Nissanka Mw, Junction, Malkaduwa, Kurunegala.<br>mahindass@gmail.com | 037-2223473<br>070-6215118 |
| Ratnapura | Dr. U. W. N. P. Wanigasekara<br>(Assistant Director) | OURC, Hidellana, Rathnapura<br>adrat@ou.ac.lk | 0452228660<br>070-6215126 |

**වගුව 12: OUSL අධ්‍යයන මධ්‍යස්ථාන**

| Centres | WhatsApp Number | Contact Number |
|---|---|---|
| Ambalangoda Study Centre | 070-6125101 | 091-2258585 |
| Ambalantota Study Centre | 070-6125102 | 047-2225533 |
| Ampara Study Centre | 070-6125103 | 063-2222052 |
| Bandarawela Study Centre | 070-6125106 | 057-2222820<br>057-2223747 |
| Galle Study Centre | 070-6125109 | 091-2223784<br>091-2227411 |
| Gampaha Study Centre | 070-6125110 | 033-2234571<br>033-2234572 |
| Hatton Study Centre | 070-6125111 | 051-2225139 |
| Kalutura Study Centre | 070-6125113 | 034-2223399<br>034-2223286 |
| Kegalle Study Centre | 070-6125115 | 035-2222501 |
| Kilinochchi Study Centre | 070-6125116 | 021-2283970 |
| Mannar Study Centre | 070-6125119 | 023-2251999 |
| Matale Study Centre | 070-6125120 | |
